පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ජූලි තෙවන සතිය

ශ්‍රේණිය - 9

සැකසුම - එම්.නීලිකා දිල්හාරි


# සති පාසල කාර්යය පත්‍රිකාව

නිපුණතාව2.0: පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.

නිපුණතා මට්ටම2.2: ස්වභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි.


ක්‍රියාකාරකම-2.2.2 : පෙට්ටියක්,කුඩා මැටි කළයක්,විනිවිද පෙනෙන බෝතලයක දැමූ අරලිය මල් සහ කොළ සහිත අත්තක් සම්පිණ්ඩනය කර වර්ණ කරමු.

පෙර ඉගෙනුම් අවස්ථා/.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්






## රේඛා ඇඳීම ප්‍රගුණකිරීම

- අඳින කඩදාසියේ ඉහළ සිට පහලට තිරස් රේඛා රූල භාවිතයෙන් තොරව ඇඳීම සිදු කරන්න
- අඳින කඩදාසියේ සිරස් අතට දිගු රේඛා ඇඳීම සිදු කරන්න
- ආනත හා නිදහස් රේඛා අඳීම සිදු කරන්න.
- ජ්‍යාමිතික උපකරණ භාවිතා නොකර පැන්සල පමණක් භාවිත කිරීම කළ යුතුය.




පැන්සලය භාවිතා කරමින් මිනුම් ලබා ගැනීම හා පරිමානය ලබා ගැනීම












නිවැරදිව මිනුම් ලබා ගැනීම වැදගත් වේ පරිමානය පිළිබඳ ක්‍රමයෙන් සැලකිලිමත් වන්න.


01.පහත දැක්වෙන මූලික රේඛා සටහන් හොදින් අධ්‍යයනය කරන්න.









02.ද්‍රව්‍ය බලා ඇඳීම සම්බන්ධව සැකසුනු වීඩියෝ පට බලන්න.ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උපයෝගි කර ගන්න.

https://youtu.be/kRaMalozzR4

https://youtu.be/5JtM4fWvkCk

https://youtu.be/1HXo6vDcTO8

3.ඉහත ද්‍රව්‍ය බලා ඇඳීම ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක-


- e-තක්සලාව
- you tube-
- ආදර්ශ සිතුවම්-
- අතිරේක පොත්/ සගරා
- ද්‍රව්‍ය බලා ඇඳීම සම්බන්ධ පොත්

4. ද්‍රව්‍ය බලා ඇඳීමකදී සැලකිලිමත් විය යුතු කරුණු


.

- මෙම අභ්‍යාස සිදු කිරීමේදී අත සැහැල්ලුවෙන් ඇඳීම කළ යුතුය.
- අත ඇඳීන කඩදාසිය මත තබා ගැනීම නොකළ යුතුය. අත කඩදාසියෙන් ඔසවා (කඩදාසියේ ගෑවෙන නොගෑවෙන තරමට) ඇඳීම සිදු කරන්න.
- අත සැහැල්ලුවෙන් චිත්‍ර ඇඳීම පුරුද්දක් කරගන්න.

ද්‍රව්‍ය බලා ඇඳීම චිත්‍රයක් නිර්මාණයේදී පළමුව රේඛා ඇඳීම ප්‍රගුණ කරන්න.




.




විවිධ ඇස් මට්ටම් තුළ පිහිටවමින් ඇඳීම සිදුකරන්න. ඇස් මට්ටම හා පර්යාවලෝකය හා ක්ෂයවෘද්ධිය පිළිබඳ සැළකිලිමත් වෙමින් අභ්‍යාස සිදු කරන්න.


පර්යාවලෝකය - වස්තුවක් ඈතට යත් ම කුඩාවී පෙනීම

ක්ෂයවෘද්ධිය - වස්තුවක් ඉදිරියට පෙනෙනවිට කෙටිවී පෙනීම

විවිධ ජ්‍යාමිතික හැඩ ඇඳීම සිදුකරන්න



## ඝනකාභ හැඩ වස්තූන් සංරචනය






1, 2, 3, 4 පියවර අනුව ඇඳීම ප්‍රගුණ කරන්න

1, 2, 3, 5 පියවර අනුව ඇඳීම සිදුකර වර්ණ කිරීම ප්‍රගුණ කරන්න

# වෘත්ත ඇඳීම ප්‍රගුණකිරීම


- කුඩා වෘත්තයක සිට විශාල වෘත්තයක් දක්වා ඇඳීම සිදු කරන්න.
- ඉලිප්සාකාර හැඩ ඇඳීම සිදු කරන්න.
- ආනතියෙන් යුතු වෘත්ත හා ඉලිප්ස ඇඳීම සිදු කරන්න
- ජ්‍යාමිතික උපකරණ භාවිතා නොකර පැන්සල පමණක් භාවිත කිරීම කළ යුතුය.





- අඟල් 4ක පමණ පරතරය සහිතව තිත් දෙකක් තබා තිත් දෙක යාකරමින් වෘත්තයක් අඳින්න.
- ක්‍රමයෙන් තිත් අතර පරතර වැඩි කරමින් අභ්‍යාස සිදු කරන්න.
- තිත් 3 හා 4 තබා පෙර ක්‍රියායාරකම සිදු කරන්න.

# සංකීර්ණ හැඩ ඇඳීම



ඉහත අභ්‍යාසවලදී පුහුණු කළ සරල හැඩතල භාවිත කරමින් සංකීර්ණ හැඩ ඇඳීමට උත්සාහ කරන්න.
ආලෝකය ලැබෙන අයුරු නිරීක්ෂණය කර දැඩි ආලෝකය, මඳ අඳුර, දැඩි අඳුර, සෙවනැලි අධ්‍යයනය කරමින් වර්ණ කරන්න.






සංකීර්ණ හැඩ ඇඳීම



වස්තූන් හොඳින් අධ්‍යයනය කර හැඩතල අවබෝධ කරගනිමින් අධ්‍යාස සිදු කරන්න.



I. ඔබ ඉදිරියේ ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
II. ද්‍රව්‍ය එකිනෙක අතර පරිමාවේ වෙනස,විවිධ හැඩ සහ ස්වභාවයන් හඳුනාගන්න.
III. ද්‍රව්‍ය සමූහයේ සමස්ත පරිමාව පිළිබඳ අවබෝධයෙන් තලයට ගැළපෙන සේ පරිමාණානුකූලව ද්‍රව්‍ය සමූහය රේඛාවෙන් අඳින්න.
IV. රේඛාවේ ශක්තීන් සුදුසු පරිදි යොදාගෙන එළිය අඳුර සහ ත්‍රිමාන ලක්ෂණ මතු කර දක්වන්න.
V. වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම අනුගමනය කරමින් වර්ණ කරන්න.





**<u>ඉගෙනුම් පල</u>**

- ද්‍රව්‍යවල දක්නට ලැබෙන විවිධත්වය විස්තර කරයි.
- තලය හා අවකාශය නිසි ලෙස භාවිතා කර ද්‍රව්‍යය සමූහය පරිමානුකූලව අඳියි.
- ද්‍රව්‍ය බලා ඇඳීමට අදාළ සිද්ධාන්ත නිසි ලෙස අනුගමනය කරයි.

- වර්ණ මාධ්‍යයට උචිත  ශිල්ප ක්‍රම නිවැරදිව භාවිතා කරමින් ද්‍රව්‍යය සමූහය සම්පිණ්ඩනය කරයි.
- නිර්මාණ අගයමින් රස විදියි.

<u>පසු ඉගෙනුම් අවස්ථා</u>

- ඔබ නිවසේ ඇති විවිධ භාණ්ඩ දළ සටහන් පොතක් ආධාරයෙන් ඇද තබාගන්න.
- එය පුරුද්දක් ලෙස අනුගමනය කරන්න.
- නිතර නිතර අභ්‍යාසකරණයේ යෙදෙන්න.

## <u>බාහිර ඉගෙනුම් අවස්ථා /සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සදහා උපකාර කර ගත හැකි දේ.</u>

**පොත්පත්-**

- ද්‍රව්‍ය බලා ඇඳීම **-තිලකරත්න දිගන්වෙල**
  - ද්‍රව්‍ය බලා ඇඳීම-සනත් ධර්මබන්දු
  - ද්‍රව්‍ය බලා අඳීමු-ඩබ්.එස්.විදානගම
  - **A Guide to Still Life Art**
  - **Painting still lifes-roig,Gabriel martin**

**යූ ටියුබ් සබැදි-**

https://youtu.be/kRaMalozzR4

https://youtu.be/5JtM4fWvkCk

https://youtu.be/1HXo6vDcTO8

.ඊ පාසල් පාඩම්- e thakshalawa-www.e-thaksalawa.moe.gov.lk